# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2488/05 - 2026 මැයි මස 11 වැනි සඳුදා - 2026.05.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්**

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ**

**වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ**

**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ රාමසුන්දරම් රාමක්‍රිෂ්ණන් මහතා අයත් වන්නා වූ සර්වජන බලය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සූසයි ලාසරස් ඇන්තෝනි මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කෙංගාදරන් මුගුන්දන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාරව, ක්‍රියා කරමින් සූසයි ලාසරස් ඇන්තෝනි මහතා, වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**කෙංගාදරන් මුගුන්දන්,**
තේරීම්භාර නිලධාරි,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

2026 මැයි මස 11 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
වවුනියාව.

EOG 05 - 0112




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ**
**සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ රණවක ආරච්චිගේ දොන් ජනක මහතා අයත් වන්නා වූ පොදුජන එක්සත් පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා හේමන්ත ප්‍රිය දර්ශන නිශ්ශංක මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ තේරීම්භාර නිලධාරි පියුමි ආටිගල වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාරව, ක්‍රියා කරමින් හේමන්ත ප්‍රිය දර්ශන නිශ්ශංක මහතා, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**පියුමි ආටිගල,**
තේරීම්භාර නිලධාරි,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව.

2026 මැයි මස 11 වැනි දින,
කොළඹ නාගරික මැතිවරණ කාර්යාලය.

EOG 05 - 0113

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.